Lesson 11 **වර්තමානයේ සිදුවෙමින් පවතින ක්‍රියා**

තවත් උදාහරණ

අපි පසුගිය පාඩමෙන් ඉගෙන ගත්තේ වර්තමානයේ සිදුවෙමින් පවතින ක්‍රියාවන් ප්‍රකාශ කරන ආකාරය. ඒ කාලයට කියන්නේ (tense එක) Present continuous tense කියලා. එහි වාක්‍ය සැකසීම උනේ කොහොමද කියලා යලිත් පොඩ්ඩක් මතක් කරගමු

කතෘ +am /is /are + ක්‍රියා පදය+ing

නැවත වාක්‍ය කීපයක් මතක් කර ගනිමු

I am reading a book

She is cooking in the kitchen

They are playing cards

එහි නැතාර්ථය ලැබෙන්නේ am /is /are වලට නොට් එකතු වීමෙන්

She is not cooking in the kitchen

ප්‍රශ්නාර්ථය ලැබෙන්නේ am /is /are වාක්‍යයේ මුලට පැමිණීමෙන්

Are they playing cards ?

අපි මේ පාඩමේදී ඉගෙන ගන්නෙ සිදුවෙමින් පවතින ක්‍රියා සදහා තවත් උදාහරණ. ඉංග්‍රීසි කතාවේදී අපි වැඩි වශයෙන්ම භාවිතා කරන කාලය මෙයයි කිව්වොත් වැරදි නැහැ .විශාල පරාසයක අදහාස් ප්‍රකාශ කිරීමට මෙය භාවිතා වෙනවා . වෙන කිසිම පන්තියක, පාඨමාලවක හෝ පැකේජයක ඔබට නොලැබෙන ඉතාම ලස්සන ප්‍රයෝගික ව්‍යවහාරයේ නිතර භාවිතා වන කදිම වාක්‍ය මෙහි දී තිබෙනවා .ඒවා ඉතා හොදින් මතක තබා ගෙන ප්‍රයෝගික කතාබහේදී භාවිතා කරන්න . ඉන් ඔබේ ඉංග්‍රීසි වඩ වඩාත් ලස්සන වේවි . මෙහිදීත් ඇතැම් විට වෙනත් කාල වල වාක්‍ය සහ ව්‍යාකරන රටාවන්ද සම්බන්ධව තිබිය හැකියි. ඒ සියල්ල හොදින් අධ්‍යනය ඒවා කර ඔබේ භාවිතයට එක් කරගන්න උත්සාහ කරන්න.

It’s getting dark
ඉට්ස් ගෙට්ටිං ඩාක්
කළුවර වැටී ගෙන එන්නෙ

It’s raining hard
ඉට්ස් රේනිං හාඩ්
හයියෙන් වහිනවා

We are getting late, hurry up !
වී ආ ගෙට්ටිං ලේට්, හරි අප් !
අපිට පරක්කු වෙනවා , ඉක්මන් කරන්න !

There ! The bus is coming
දෙයා ! ද බස් ඉස් කමිං
අන්න ! බස් එක එනවා

He is getting ready for work
හී ඉස් ගෙට්ටිං රෙඩි ෆෝ ව(ර්)ක්
ඔහු වැඩට යන්න ලෑහැස්ති වෙනවා

You are wasting money in vain
යූ ආ වේස්ට්ටිං මනි ඉන් වේන් .
ඔයා නිකරුනේ සල්ලි
නාස්තිකරනවා.

මෙහිදී සිංහල තේරුම් වල බොහෝවිට “කරමින් ඉන්නවා “කියන කෑල්ල දී නැහැ. මොකද අපි සාමාන්‍ය සිංහල කථාවේදී එහෙම කියන්නෙ නැති නිසා.
“ඔහු වැඩට යන්න ලෑහැස්ති වෙමින් ඉන්නවා.” කියල කවුරුවත් සිංහලෙන් කියන්නේ නැහැ. “ ඔහු වැඩට යන්න ලෑහැස්ති වෙනවා” ඒ විදියට තමයි කියන්නෙ. නමුත් ඉංග්‍රීසි වාක්‍යයේ අර්ථය අනුව ඒ ක්‍රියාව මේ මොහොතේ සිදුවෙමින් පවතින ක්‍රියාවක්. බොහෝවිට
මේ වාක්‍ය වල සිංහල තේරුම් විදියට අපි දී තිබෙන්නේ සිංහල කට වහරේ එය කියවෙන්න වැඩියෙන්ම ඉඩ තිබෙන විදිය

I am just going off this way
අයෑම් ජස්ට් ගොයිං ඕෆ් දිස් වේ
මම නිකන් මේ පැත්තට යනවා

My body is aching all over
මයි බොඩි ඉස් ඒකිං ඕල් ඕව(ර්)
මගෙ මුළු ඇඟම කකියනවා

I am sweating all over
අයෑම් ස්වෙට්ටිං ඕල් ඕව(ර්)
මගෙ මුළු ඇඟ පුරාම දාඩිය දානවා

My wound is bleeding
මයි වුන්ඩ් ඉස් බ්ලීඩින්
මගෙ තුවාලෙන් ලේ එනවා

You are making so much noise
යූ ආ මේකිං සෝ මච් නොයිස්
ඔයා හරියට සද්ද කරනවා

You are making so many mistakes
යූ ආ මේකිං සෝ මෙනි මිස්ටේක්ස්
ඔයා ගොඩක් වරද්දනවා

I am having/taking a bath
අයෑම් හැවිං / ටේකිං අ බාත්
මම නානගමන්

You are talking nonsense
යූ ආ ටෝකිං නොන්සන්ස්
ඔයා පිස්සු කතා කරන්නේ

(have කියන පදය සැබෑ ක්‍රියාපදයක් නෙවෙයි. එය ‘තියෙනවා” කියන අදහස දෙන උප ක්‍රියා පදය. නමුත් මෙහිදී එය සැබෑ ක්‍රියාපදයක් ලෙස භාවිතා කොට එයට ing එකතු කර තිබෙනවා. එවිට ඉන් අදහස් වෙන්නෙ “අරගනිමින් ඉන්නවා “වැනි අර්ථයක්. Lunch, dinner, bath, shower වැනී දෙයක් අරගන්නවා කියන අදහස ඉන් ලැබෙන්නෙ.)

He is having/ taking his lunch now

හී ඉස් හැවින් / ටේකිං හිස් ලන්ච් නව්

ඔහු දිවා ආහාරය ගන්න ගමන්

I am having a big problem

අයෑම් හැවිං අ බිග් ප්‍රොබ්ලම්

මට ලොකු ප්‍රශ්නයක් තියෙනවා

*We are having a meeting today

වී ආ හැවිං අ මීටිං ටුඩේ

අද අපිට රැස්වීමක් තියෙනව

*(මෙයත් නිශ්චිතව සිදුකිරීමට සැලසුම් කර ඇති අනාගත ක්‍රියාවක් )

I am having a headache

අයැම් හැවිං අ හෙඩෙක්

මට ඔලුවෙ කැක්කුමක් තියෙනවා

He is going to marry her

හී ඉස් ගොයිං ටු මැරී හ(ර්)

ඔහු ඇයව බඳින්න යන්නෙ

You are lying

යූ ආ ලයිං

ඔයා බොරු කියන්නෙ

You are trying to cheat us
යූ ආ ට්‍රයිං ටු චීට් අස්

ඔයා හදන්නෙ අපිව රවට්ටන්න

You are doing it wrong
යූ ආ ඩූයිං ඉට් රෝං

ඔයා වැරදියට ඒක කරන්නේ

Life is getting increasingly difficult

ලයිෆ් ඉස් ගෙටිං ඉන්ක්‍රීසිංලි ඩිෆිකල්ට්

එන්න එන්නම ජීවතේ අමාරුවෙනවා

You are scaring me

යූ ආ ස්කෙයාරිං මී

ඔයා මාව බය කරනවා

I am staying in Nawala now

අයි ඇම් ස්ටේයිං ඉන් නාවල නව්

මම දැන් නැවතිලා ඉන්නෙ නාවල

She is wearing a beautiful saree.

ෂි ඉස් වෙයාරිං අ බියුටිෆුල් සාරි.

ඇය ලස්සන සාරියක් ඇඳල ඉන්නවා.

My hair is falling out

මයි හෙයා(ර්) ඉස් ෆෝලිං අවුට්

මගෙ කොන්ඩේ යනව (වැටෙනවා)

Colour of this shirt is fading off

කලු(ර්) ඔෆ් දිස් ෂ(ර්)ට් ඉස් ෆේඩින්

මේ ෂ(ර්ට් එකේ පාට යනව.

He is gradually becoming rich

හී ඉස් ග්‍රැජුඅලි බිකමිං රිච්

ඔහු ටික ටික පොහොසත් වෙනවා

Our roof is leaking

අව(ර්) රූෆ් ඉස් ලීකිං

අපේ වහල තෙමෙනවා

It’s not raining

ඉට්ස් නොට් රේනිං

වහින්නේ නෑ

It’s only drizzling

ඉට්ස් ඕන්ලි ඩ්‍රිස්ලිං

පොද ගහනවා විතරයි

I am not forcing you to do it

අයි ඇම් නොට් ෆෝසිං යු ටු ඩූ ඉට්

මම ඔයාට බලකරන්නෙ නෑ ඒක කරන්න

You are getting wet, come inside

යූ ආ ගෙටිං වෙට්, කම් ඉන්සයිඩ්

ඔයාව තෙමෙනවා ,ඇතුලට එන්න

I am not feeling well today

අයෑම් නොට් ෆීලිං වෙල් ටුඩේ

මට සනීප නැහැ (අද මට හරි නැහැ )

Are you feeling better now. ?

ආ යු ෆීලිං බෙට(ර්) නව් ?

ඔයාට දැන් සුවයක් දැනෙනවද?

I am feeling much better now

අයෑම් ෆීලිං මච් බෙට(ර්) නව්

මට දැන් සැහෙන සුවයක් දැනෙනවා

I am still feeling dizzy

අයෑම් ස්ටිල් ෆීලිං ඩිසි

මට තාම කැරකැවිල්ල වගේ

Am I disturbing you?

ඇම් අයි ඩිස්ට(ර්)බිං යු?

මම ඔයාට කරදර (බාධා) කරනවද ?

Is he still sleeping?

ඉස් හී ස්ටිල් ස්ලීපිං?

ඔහු තවම නිදිද?

Are you still schooling?

ආ යූ ස්ටිල් ස්කූලිං ?

ඔයා තවම ඉස්කෝලේ යනවද?

No, I am working

නෝ, අයෑම් ව(ර්)කිං

නෑ, මම වැඩ කරනවා

Are you going somewhere?

ආ යු ගොයිං සම්වෙයා(ර්) ?

ඔයා කොහෙවත් යනවද?

I am not going anywhere

අයෑම් නොට් ගොයිං එනිවෙයා(ර්)

මම කොහෙවත් යන්නෙ නැහැ

Are you leaving?

ආ යු ලීවිං ?

ඔයා යනවද?

(leave -යම් තැනකින් පිටත්ව යනවා )

No, I am just going out.

නෝ , අයෑම් ජස්ට් ගොයිං අවුට්

නෑ ,මම නිකන් එලියට යනවා

What are you going to do next?

වට් ආ යු ගොයිං ටු ඩූ නෙක්ස්ට් ?

ඔයා මොකක්ද ඊලඟට කරන්න යන්නේ?

This is not going to be easy.

දිස් ඉස් නොට් ගොයිං ටු බී ඊසි

මේක ලේසි වෙන්නේ නෑ(මෙය හොද වාක්‍යයක්)

Why is she crying?

වයි ඉස් ක්‍රයිං ?

ඇයි ඇය අඩන්නේ?

This is not working again

දිස් ඉස් නොට් ව(ර්)කිං අගේන් .

මේක ආපහු වැඩ කරන්නේ නෑ

Why are you insisting on me?

වයි ආ යු ඉන්සිස්ටිං ඔන් මී ?

ඇයි ඔයා මට බලකරන්නෙ? (insist - බල කරනවා )

Are you listening?

ආ යු ලිස්නිං?

ඔයා අහගෙනද ඉන්නේ?

What is he doing ?

වට් ඉස් හී ඩුයිං ?

ඔහු මොකද කරන්නේ ?

He is nodding off

හී ඉස් නොඩිං ඕෆ්

ඔහු නිදි කිරා වැටෙනවා

The show is starting now

ද ෂෝ ඉස් ස්ටාටිං නව්

ෂෝ එක දැන් පටන් ගන්නවා

Who are you phoning to ?

හූ ආ යූ ෆෝනිං ටු ?

කාටද ඔයා කෝල් කරන්නේ ?

This is stinking

දිස් ඉස් ස්ටිංකිං

මේක ගඳ ගහනවා

You are terribly smelling

යූ ආ ටෙරිබ්ලි ස්මෙලිං

ඔයා හරිම ගඳයි (ඔයාගේ ගඳ ! )

Who is screaming over there

හූ ඉස් ස්ක්‍රීමිං ඕව(ර්) දෙයා(ර්)

කව්ද අර කෑගහන්නේ අතන ?

What is going on here ?

වට්ස් ගොයිං ඔන් හියු(ර්) ?

මෙතන මොකද වෙන්නෙ ?

This is giving out a strange sound

දිස් ඉස් ගිවිං අවුට් අ ස්ට්‍රෙන්ජ් සවුන්ඩ්

මේකෙන් අමුතු සද්දයක් එනවා

This is taking too long

දිස් ඉස් ටේකින් ටූ ලෝං

මේකට ගොඩක් වෙලා යනවා

Oh , you are giving me a headache

ඔහ් . යූ ආ ගිවිං මී අ හෙඩෙක්

ඔයා නම් මහ හිසරදයක් දෙන්නේ

(ඔයා මහා වදයක් දෙන්නේ )

He is getting impatient

හී ඉස් ගෙටිං ඉම්පේෂන්ට්

ඔහු නොඉවසිලිමත් වේගෙන යනවා

We are getting old day by day

වී ආ ගෙටිං ඕල්ඩ් ඩේ බයි ඩේ

දවසින් දවස අපි වයසට යනවා

He is losing his temper

හී ඉස් ලූසිං හිස් ටෙම්ප(ර්)

ඔහුට කේන්ති යාගෙන එන්නෙ

The cost of living is skyrocketing

ද කොස්ට් ඔෆ් ලිවිං ඉස් ස්කයිරොකටිං

ජීවන වියදම රොකට් වේගෙන් ඉහල යනවා

The bell is ringing

ද බෙල් ඉස් රිගිං

බෙල් එක වදිනවා

He is not sleeping

හී ඉස් නොට් ස්ලීපිං

ඔහු නිදි නැහැ

You are not listening

යූ ආ නොට් ලිස්නිං

ඔයා අහගෙන නෙවෙයි ඉන්නේ

They are not doing it

දේ ආ නොට් ඩුයිං ඉට්

ඔවුන් ඒක කරන්නේ නැහැ

He is not wearing his shoes

හී ඉස් නොට් වෙයාරිං හිස් ෂූස්

ඔහු සපත්තු දා ගෙන නෙවෙයි ඉන්නේ

It's lightening & thundering heavily

ඉට්ස් ලයිට්නිං ඇන්ඩ් තන්ඩරිං හෙවිලි

තදින් විදුලි කොටනවා, ගොරවනවා

Why are you quarreling ?

වයි ආ යූ ක්වොරලිං ?

ඇයි ඕගොල්ලො රංඩු කරගන්නෙ ?

Why are you stammering ?

වයි ආ යූ ස්ටැමරිං ?

ඇයි ඔයා ගොත ගහන්නෙ ?

Are you kidding ?

ආ යූ කිඩිං ?

ඔයා විහිලු කරනවද ?(මෙය නුරුස්සනා ස්වරූපයෙන් අසන පැනයක් )

They are doing it again *

දේ ආ ඩුයිං ඉට් අගේන්

ඔවුන් ආයිත් ඒක කරනවා

He is coming here all the time*

හී ඉස් කමින් හියර්) ඕල් ද ටයිම්

ඔහු තිස්සෙම මෙහෙ එනවා

( මේ වාක්‍ය දෙකම අදාල ක්‍රියාවන් සම්බන්දයෙන් අප්‍රසාදය හඟවන්නේ)

Are children making noise ?

ආ චිල්ඩ්‍රන් මේකිං නොයිස් ?

ළමයි කෑගහනවද ?

Is your father going to work today ?

ඉස් යුව(ර්) ෆාද(ර්) ගොයින් ටු ව(ර්)ක් ටුඩේ ?

අද ඔයගොල්ලන්ගේ තාත්තා වැඩට යනවද ?

I am not waiting for him

අයිම් නොට් වේටිං ෆෝ හිම්

මම ඔහු එනකල් නෙවෙයි ඉන්නේ

Buses are not running today

බසස් ආ නොට් රනිං ටුඩේ

අද බස් දුවන්නේ නෑ (අද දවස තුල ඒ කාර්යය සිදුවෙමින් නොපවතින බව ඉන් කියන්නේ )

I am getting tired now, I need a little rest

අයි ඇම්(අයෑම්) ගෙටිං ටය(ර්ඩ්) නව්, අයි නීඩ් අ ලිට්ල් රෙස්ට්

මට දැන් මහන්සි දැනෙනවා, මට පොඩි විවේකයක් ඕන.

I am not blaming you (but I have to tell you this)

අයි ඇම් නොට් බ්ලේමිං යු (බට් අයි හෑව් ටු ටෙල් යු දිස් )

මම ඔයාට බනිනව නෙවෙයි (නමුත් මම මෙය ඔයාට කිව යුතුයි)

(I blamed him) Now I am feeling bad about it

(අයි බ්ලේම්ඩ් හිම්) නව් අයැම් ෆීලිං බෑඩ් අබවුට් ඉට්

( මම ඔහුට බැන්න) දැන් ඒ ගැන මගෙ හිතට හරිනෑ

(feel bad කියන්නේ සරලව හිතට හරි නෑ කියන එක . ඒ කියන්නේ කණගාටුවක්, පසුතැවීමක් , අපහසුතාවයක් හෝ අප්‍රසන්න හැඟීමක් දැනෙනවා කියන එක )

They are coming to see us tomorrow.

දේ ආ කමිං ටු සී අස් ටුමෝරෝ

ඔවුන් හෙට එනවා අපිව බලන්න

(කලින් පාඩමේදී කියවුනා මේ tense එක යොදා ගන්නවා කියල ස්ථිර වශයෙන්ම සිදු කිරීමට සැලසුම් කර තිබෙන අනාගත කාල ක්‍රියා සදහා. මේ එවැනි අවස්ථාවක් )

This is taking longer than we expected

දිස් ඉස් ටේකිං ලෝන්ග(ර්) දෑන් වී එක්ස්පෙක්ටඩ්

අපි හිතුවට වඩා මේකට වෙලා යනවා

We are conducting a Shramadaana campaign tomorrow

වී ආ කන්ඩක්ටිං අ ශ්‍රමදාන කැම්පේන් ටුමෝරෝ

අපි හෙට ශ්‍රමදාන ව්‍යාපාරයක් කරනවා

The number of road accidents is rapidly increasing

ද නම්බ(ර්) ඔෆ් රෝඩ් ඇක්සිඩන්ට්ස් ඉස් රැපිඩ්ලි ඉන්ක්‍රීසිං

මාර්ග අනතුරු සංඛයාව වේගෙන් ඉහල යනවා

(මෙහි “the number” ඒක වචන ලෙස සැලකෙන්නේ ).

Time is passing slowly when you have nothing to do

ටයිම් ඉස් පාසිං ස්ලෝව්ලි වෙන් යු හෑව් නතිං ටු ඩූ

කරන්නට දෙයක් නැති විට කාලය සෙමෙන් ගෙවී යයි

They are always fighting with each other

දේ ආ ඕල්වේස් ෆයිටිං විත් ඊච් අද(ර්)

ඔවුන් තිස්සෙම එකිනෙකා සමග රණ්ඩු කරගන්නව

This machine is giving a lot of trouble now

දිස් මැෂින් ඉස් ගිවිං අ ලොට් ඔෆ් (ලොටොෆ්) ට්‍රබල් නව්

දැන් මේ මැෂින් එක ගොඩක් ලෙඩ දෙනවා

My computer is slowing down

මයි කම්පියුටර් ඉස් ස්ලෝවිං ඩවුන්

මගෙ කොම්පියුටරේ ස්ලෝ වීගෙන යන්නෙ

Are you saying that it’s my fault?
ආ යූ සේයිං දැට් ඉට්ස් මයි ෆෝල්ට් ?
ඔයා කියන්නේ ඒක මගේ වරද කියලද ?

Life is getting increasingly difficult
ලයිෆ් ඉස් ගෙටිං ඉන්ක්‍රීසිංලි ඩිෆිකල්ට්
ජීවිතේ එන්න එන්නම අමාරු වෙනවා

ඒවා ඉතාම ලස්සන වාක්‍යය . ඒ සියල්ලම හොදින් මතක තබා ගෙන එදිනෙදා ජීවිතයේදී භාවිතා කිරීමට උත්සාහ කරන්න . එමෙන්ම ඒ වාක්‍යය වල කතෘ වරුන් , කර්මයන් සුදුසු අවස්ථා වල සුදුසු ලෙස වෙනස් කර තවත් වාක්‍යය සිය ගණනක් ඔබට ගොඩ නැගිය හැකියි . මේ භාෂාවේ නිපුණත්වය ඔබ ගොඩ නගා ගත යුත්තේ එලෙසයි

Lesson 11

## Spoken English

වෙලාව ඇසීම සහ වෙලාව කීම ගැන අපි පසුගිය පාඩමේදී ඉගෙන ගත දේවල් තවදුරටත් ඉදිරයට ගෙනියනවා මේ පාඩමේදී . ඒ අනුව වෙලාව සම්බන්ධ තවත් බොහෝ දේ මේ පාඩමේදී ඉගෙන ගන්න පුළුවන් . අපි බලමු තවත් උදාහරණ දෙබස් ඛණ්ඩ දෙස

Dialogue 30

A: Do you have the time?

ඩූ යූ හැව් ද ටයිම්?

ඔයා ළඟ වෙලාව තියෙනවද ? ( ඔයාට වෙලාව කියන්න පුළුවන්ද? )

B: Sorry, I don’t have a watch.

සෝරි, අයි ඩෝන්ට් හැව් අ වොච්.

සමාවෙන්න, මට අත් ඔරලෝසුවක් නැහැ

Dialogue 31

A: Could you please tell me the time?

කුඩ් යූ ප්ලීස් ටෙල් මී ද ටයිම්?

කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: Sorry, I don’t have the time.

සෝරි, අයි ඩෝන්ට් හෑව් ද ටයිම්.

සමාවෙන්න, මා ළඟ වෙලාව නැහැ

Dialogue 32

A: Do you know what time it is now?

ඩූ යූ නෝ වට් ටයිම් ඉටිස් නව්?

ඔයා දන්නවද දැන් වෙලාව කීයද කියලා?

B: I’m sorry, I didn’t check the time.

අයිම් සෝරි, අයි ඩිඩන්ට් චෙක් ද ටයිම්.

සමාවෙන්න, මම වෙලාව බැලුවේ නෑ.

Dialogue 33

A: Can you tell me the time, please?

කැන් යූ ටෙල් මී ද ටයිම්, ප්ලීස්?

කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: I don’t know, I left my watch at home.

අයි ඩෝන්ට් නෝ, අයි ලෙෆ්ට් මයි වොච් ඇට් හෝම්.

මට දන්නේ  නෑ, මගේ ඔරලෝසුව ගෙදර තියලා ආවෙ

Dialogue 34

A: Can you tell me the time, please?
කැන් යූ ටෙල් මී ද ටයිම්, ප්ලීස්?
කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: I'm not sure , my watch isn't working properly.
අයිම් නොට් ෂුව(ර්), මයි වොච් ඉසන්ට් ව(ර්)කිං ප්‍රොප(ර්)ලි.
මට විස්වාස නැහැ (වෙලාව කියන්න හැකිවෙයි කියලා ) මගේ ඔරලෝසුව හරියට වැඩ කරන්නේ නැහැ.

Dialogue 35

A: Could you tell me the time, please?
කුඩ් යූ ටෙල් මී ද ටයිම්, ප්ලීස්?
කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: Sorry, my phone is off. I can't check the time.
සෝරි, මයි ෆෝන් ඉස් ඕෆ්. අයි කාන්ට් චෙක් ද ටයිම්.
සමාවෙන්න, මගේ ෆෝන් එක ඕෆ් වෙලා . මට වෙලාව බලන්න විදියක් නැහැ

Dialogue 36

A: Do you know what time it is now?
ඩූ යූ නෝ වට් ටයිම් ඉටිස් නව්?
ඔයා දන්නවද දැන් වෙලාව කීයද කියලා?

B: Sorry, I'm not wearing my watch today.
සෝරි, අයිම් නොට් වෙයාරිං මයි වොච් ටුඩේ.
සමාවෙන්න, අද මම ඔරලෝසුව බැඳලා නෑ

Dialogue 37

A: Do you know the time?

ඩූ යූ නෝ ද ටයිම්?

ඔයා වෙලාව දන්නවද ?

B: Sorry, I have no idea. It should be around 7 now.

සොරි, අයි හැව් නෝ අයිඩියා. ඉට් ෂුඩ් බී අරවුන්ඩ් සෙවන් නව්.

සමාවෙන්න, මට කිසිම අදහසක් නෑ( මම දන්නේ නෑ ) දැන් 7 ට විතර වෙන්න ඕන

Dialogue 38

A: What time do you think it is now?

වට් ටයිම් ඩූ යූ තිංක් ඉට්ස් නව්?

ඔයා හිතන්නෙ දැන් වෙලාව කීයද?

B: I'm not sure. It should be around 4 at dawn.

අයිම් නොට් ෂුව(ර්). ඉට් ෂුඩ් බී අරවුන්ඩ් ෆෝ ඇට් ඩෝන්.

මට විශ්වාස නෑ. පාන්දර 4ට විතර වෙන්න ඕන

Dialogue 39

A: What time is it now?

වට් ටයිම් ඉසිට් නව්?

දැන් වෙලාව කීයද?

B: It shows 6:40, but my watch is 10 minutes fast.

ඉට් ශෝස් සික්ස් ෆෝටි, බට් මයි වොච් ඉස් ටෙන් මිනිට්ස් ෆාස්ට්.

6 : 40 පෙන්නන්නේ , නමුත් මගේ ඔරලෝසුව මිනිත්තු 10කින් වැඩියි

Dialogue 40

A: Do you know the time now?

ඩූ යූ නෝ ද ටයිම් නව්?

ඔයා දැන් වෙලාව දන්නවද ?

B: It shows 5:20, but my watch is 10 minutes slow.

ඉට් ශෝස් ෆයිව් ටුවෙන්ටි, බට් මයි වොච් ඉස් ටෙන් මිනට්ස් ස්ලෝ.

වෙලාව 5:20 පෙන්නන්නේ , නමුත් මගේ ඔරලෝසුව මිනිත්තු 10ක් අඩුයි .

Dialogue 41

A: Can you please tell me the time?

කැන් යූ ප්ලීස් ටෙල් මී ද ටයිම්?

කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: It shows 8:15, but I'm not sure if it's correct.

ඉට් ශෝස් එයිට් ෆිෆ්ටීන්, බට් අයිම් නොට් ෂුව(ර්) ඉට්ස් කරෙක්ට්.

වෙලාව 8:15ක් කියලා පෙන්නනවා , හැබැයි ඒක හරිද කියලා මට විශ්වාසයක් නෑ.

Dialogue 42

A: Can you please tell me the time?

කැන් යූ ප්ලීස් ටෙල් මී ද ටයිම්?

කරුණාකර මට වෙලාව කියන්න පුළුවන්ද?

B: It shows 8:15, but it might be wrong

ඉට් ශෝස් එයිට් ෆිෆ්ටීන් , බට් ඉට් මයිට් බී රෝං

අටයි කාල පෙන්නන්නෙ , නමුත් ඒක වැරදි වෙන්න පුළුවන්

Dialogue 43

A: Is there a way to know the time?
ඉස් දෙයා අ වේ ටු නෝ ද ටයිම්?
වෙලාව දැනගන්න විදියක් තියෙනවද ?

B: No, there’s no way. It should be around 3 by the sun
නෝ, දෙයා‘ ස් නෝ වේ. ඉට් ශුඩ් බී අරවුන්ඩ් ත්‍රී බයි ද සන්
නෑ, විදිහක් නෑ. . ඉර අව්වේ විදියටනම් 3 විතර වෙන්න ඕන

Dialogue 44

A: It’s getting dark. Can you guess the time now?
ඉට්ස් ගෙට්ං ඩාක්. කැන් යූ ගෙස් ද ටයිම් නව්?
කළුවර වීගෙන එනවා . දැන් වෙලාව ඔයා හිතාගන්න පුළුවන්ද?

B: Mm.., I’m not sure, but it should be around 6.
ම්.., අයිම් නොට් ෂුව(ර්), බට් ඉට් ශුඩ් බී අරවුන්ඩ් සික්ස්.
ම්.., මට විශ්වාස නැහැ, හැබැයි වෙලාව 6 පමණ වෙන්න ඇති.

හොදයි, ඉහත දෙබස් ඛණ්ඩ වලට අමතරව කාලය පිලිබඳ මේ විමසීම් සහ පිලිතුරුත් මතක තියා ගන්න , ඒවා ඉතාම ප්‍රයෝජනවත් වේවි

A: When is the next class ?
වෙන් ඉස් ද නෙක්ස්ට් ක්ලාස් ?
ඊලග පන්තිය කීයටද

B: The next class is at 9 o’clock.
ද නෙක්ස්ට් ක්ලාස් ඉස් ඇට් නයින් ඔක්ලොක්
ඊලග පන්තිය 9ට

A: What time is the next class starting ?

වට් ටයිම් ඉස් ද නෙක්ස්ට් ක්ලාස් ස්ටාටිං ?

කීයටද ඊලග ක්ලාස් එක පටන් ගන්නේ ?

B: It's starting at 10 o'clock.

ඊට්ස් ස්ටාටිං ඇට් ටෙන් ඔක්ලොක්.

ඊලග පන්තිය 10ට පටන් ගන්නවා .

B: The next class will begin at 8:30.

ද නෙක්ස්ට් ක්ලාස් විල් බිගින් ඇට් එයිට් ත(ර්ට්

ඊලග පන්තිය 8:30ට පටන් ගන්නවා .

B: It starts at 11 o'clock sharp.

ඊට් ස්ටාට්ස් ඇට් ඉලවින් ඔක්ලොක් ෂාප්.

ඊලග පන්තිය හරියට 11ට පටන් පටන් ගන්නවා .

B: I'm not sure, but it should be at 1:15.

අයිම් නොට් ෂුව(ර්), බට් ඉට් ශුඩ් බී ඇට් වන් ෆිෆ්ටීන්.

මට විශ්වාස නැහැ, නමුත් 1:15 වෙන්න ඕනා .

A: How much time do we have ?

හව් මච් ටයිම් ඩූ වී හෑව් ?

අපිට කොච්චර වෙලා තියෙනවද ?

How much time do we have before the next class ?

හව් මච් ටයිම් ඩූ වී හෑව් බිෆෝ ද නෙක්ස්ට් ක්ලාස් ?

ඊලග පන්තියට කලින් අපිට කොච්චර වෙලාව තියෙනවද ?

Do we have enough time ?

ඩූ වී හෑව් ඉනෆ් ටයිම් ?

අපිට ප්‍රමාණවත් වෙලාවක් තියෙනවද ? / අපිට වෙලා ඇතිද ?

B: We have about 20 minutes

වී හෑව් අබවුට් ට්වේන්ටි මිනිට්ස්

අපිට මිනිත්තු 20 පමණ තියෙනවා

We have around 10 minutes left

වී හෑව් අරවුන්ඩ් ටෙන් මිනිට්ස් ලෙෆ්ට්

අපිට මිනිත්තු 10 විතර ඉතුරු වෙලා තියෙනවා

There's only 5 minutes left.

දෙයා'ස් ඔන්ලි ෆයිව් මිනිට්ස් ලෙෆ්ට්

අපිට මිනිත්තු 5 ක් විතරයි ඉතුරු වෙලා තියෙන්නේ .

We have plenty of time, about 30 minutes.

වී හෑව් ප්ලෙන්ටි ඔෆ් ටයිම්, අබවුට් ත(ර්)ටි මිනිට්ස්.

අපිට ඕන තරම් වෙලාව තියෙනවා, මිනිත්තු 30 ක් විතර

I'm not sure exactly, but maybe 15 minutes.

අයිම් නොට් ෂුව(ර්) එක්සෑක්ට්ලි, බට් මේ බී ෆිෆ්ටීන් මිනිට්ස්.

මට හරියට විශ්වාස නැහැ, නමුත් මිනිත්තු 15 ක් විතර ඇති

B: We should have about an hour.

වී ෂුඩ් හෑව් අබවුට් ඇන් අව(ර්).

අපිට පැයක් විතර තියෙන්න ඕන (තිබිය යුතුයි )

A: Do we have enough time to finish this ?

ඩූ වී හෑව් ඉනෆ් ටයිම් ටු ෆිනිෂ් දිස් ?

අපිට වෙලාව ඇතිද මේක ඉවර කරන්න ?

Yes, we have enough time to do it

යෙස්, වී හෑව් ඉනෆ් ටයිම් ටු ඩූ ඉට්

ඔව්, අපිට මේක කරන්න ප්‍රමාණවත් වෙලාව තියෙනවා.

No, we don't have enough time.

නෝ, වී ඩෝන්ට් හෑව් ඉනෆ් ටයිම්.

නැහැ, අපිට ප්‍රමාණවත් වෙලාව නැහැ.

We have just enough time.

වී හෑව් ජස්ට් ඉනෆ් ටයිම්.

අපිට යන්තම් වෙලාව තියෙනවා.

Yes, we have plenty of time to do it

යෙස්, වී හෑව් ප්ලෙන්ටි ඔෆ් ටයිම් ටු ඩූ ඉට්

ඔව්, අපිට මේක ඉවර කරන්න ඕන තරම් වෙලාව තියෙනවා.

A: How much more time do we have ?

හව් මච් මෝ ටයිම් ඩූ වී හෑව් ?

අපිට තව කොච්චර වෙලාව තියෙනවද ?

B: We have about 15 more minutes.

වී හෑව් අබවුට් ෆිෆ්ටීන් මෝ මිනිට්ස්.

අපිට තව අසන්නට 15 මිනිත්තු පමණ තියෙනවා

We have 10 more minutes

වී හෑව් ටෙන් මෝ මිනිට්ස්

අපිට තව මිනිත්තු දහයක් තියෙනවා

We have more than 10 minutes

වී හෑව් මෝ දෑන් ටෙන් මිනිට්ස්

අපිට මිනිත්තු දහයකට වඩා තියෙනවා

We still have time
වී ස්ටිල් හෑව් ටයිම්
අපිට තාම වෙලාව තියෙනවා

We still have 10 minutes
වී ස්ටිල් හෑව් ටෙන් මිනිට්ස්
අපිට තවමත් මිනිත්තු දහයක් තියෙනවා

A: How much time is left ?
හව් මච් ටයිම් ඉස් ලෙෆ්ට් ?
තව කොච්චර වෙලාව ඉතුරුද ?

B: Only 5 minutes left.
ඔන්ලි ෆයිව් මිනට්ස් ලෙෆ්ට්.
අපිට තව අසන්නට 5 මිනිත්තු පමණ ඉතිරියි.

Only 10 minutes left
ඔන්ලි ටෙන් මිනිට්ස් ලෙෆ්ට්
මිනිත්තු දහයක් විතරයි ඉතුරු

There are about 25 minutes left.
දෙයා ආ අබවුට් ට්වේන්ටි ෆයිව් මිනිට්ස් ලෙෆ්ට්.
තව අසන්නට 25 මිනිත්තු පමණ ඉතිරිව තියෙනවා.

A: Do we have enough time ?
ඩූ වී හෑව් ඉනෆ් ටයිම් ?
අපිට ප්‍රමාණවත් කාලය තියෙනවද ?

B: We still have enough time
වී ස්ටිල් හෑව් ඉනෆ් ටයිම්
අපිට තාම ප්‍රමාණවත් කාලය තියෙනවා

We don't have enough time
වී ඩෝන්ට් හෑව් ඉනෆ් ටයිම්
අපිට ප්‍රමාණවත් කාලය නැහැ

We don't have a lot of time
වී ඩෝන්ට් හෑව් අ ලොට් ඔෆ් (ලොටොෆ්) ටයිම්
අපිට ගොඩක් වෙලාව නැහැ

We don't have a lot of time to waste
වී ඩෝන්ට් හෑව් අ ලොට් ඔෆ් ටයිම් ටු වේස්ට්
අපිට ගොඩක් වෙලාව නැහැ නාස්ති කරන්න

Hurry up !
හරි අප්
ඉක්මන් කරන්න

No hurry, take your time
නෝ හරි , ටේක් යුව(ර්) ටයිම්
හදිස්සියක් නෑ , වෙලාව ගන්න (වෙලාව අරගෙන කරන්න)

Hurry up, we are running out of time
හරිඅප් , වී ආ රනිං අවුට් ඔෆ් ටයිම්
ඉක්මන් කරන්න , අපිට කාලය නැති වේගෙන යන්නේ (කාලය ඉවර වේගෙන යන්නේ )

You are wasting time
යූ ආ වේස්ටිං ටයිම්
ඔයා වෙලාව නාස්ති කරනවා

We are getting late

වී ආ ගෙටිං ලේට්

අපි පරක්කු වෙනවා

Time’s running out.

ටයිම්ස් රනින් අවුට්

වෙලාව අවසන් වෙමින් යන්නේ .

There’s very little time left.

දෙයා’ස් වෙරි ලිට්ල් ටයිම් ලෙෆ්ට්.

තව ඉතිරිව තියෙන බොහොම ටික වෙලාවයි

We’re almost out of time.
වී ආ ඕල් මෝස්ට් අවුට් ඔෆ් ටයිම්.
අපිට වෙලාව ඇත්තෙම නැති තරම් .

It‘s time to finish

ඉට්ස් ටයිම් ටු ෆිනිෂ්

ඉවර කරන්න වෙලාව හරි

Time is almost up.

ටයිම් ඉස් ඕල්මෝස්ට් අප්.

වෙලාව ඉවර වෙන්න ඔන්න මෙන්න

Time ‘s up

ටයිම්’ ස් අප්

වෙලාව ඉවරයි

ඒ කෙටි සංවාද වලදී වෙලාව අහපු හැටි වගේම වෙලාව කියපු හැටි හොඳට මතක තබා ගන්න. ඒවා ඉතාම ප්‍රයෝජනවත්. ඒ වගේම ඒවා ඉතාම නිවැරදි ඉංග්‍රීසි. ඔබට ලෝකයේ ඕනෑම තැනක නොබියව පාවිච්චි කල හැකියි

**Vocabulary 11**

Get dark – ගෙට් ඩාක් – අඳුරු වෙනවා

Hurry up – හරි අප් – ඉක්මන් කරන්න

Waste – වේස්ට් – නාස්ති කරනවා , අපතේ යවනවා

In vain – ඉන් වේන් – නිෂ්ඵලව, නිරපරාදේ

Get ready – ගෙට් රෙඩි – සූදානම් වෙනවා

Ache – ඒක් – රිදෙනවා , කැක්කුම ගන්නවා , වේදනාව

Stomach ache – ස්ටමක් ඒක් – බඩේ කැක්කුම

Toothache – ටූත් ඒක් – දතේ  කැක්කුම

Earache – ඉය(ර්) ඒක් (ඉයරේක් ) – කනේ කැක්කුම

Sweat – ස්වෙට් – දාඩිය දානවා , දාඩිය

Wound – වුන්ඩ් – තුවාලය

Nonsense – නොන්සන්ස් – පිස්සු , විකාර කතා

Marry – මැරී  – විවාහ වෙනවා

Lie – ලයි – බොරු කියනවා ,බොරුව

Cheat – චීට් – වංචා කරනවා

Increasingly – ඉන්ක්‍රීසිංලි – වැඩි වැඩියෙන්

Scare – ස්කෙයා  – බය කරනවා

Stay – ස්ටේ – රැඳී සිටිනවා ,නතරව ඉන්නවා

Wear – වෙයා  – අඳිනවා , පළඳිනවා

Fade – ෆේඩ් – දුර්වර්ණ වෙනවා ,  මැකී යනවා

Gradually – ග්‍රැජුවලි – ක්‍රම ක්‍රමයෙන්

Become – බිකම් – (බවට) පත්වෙනවා

Roof – රූෆ් – වහල

Leak – ලීක් – කාන්දු වෙනවා

Force – ෆෝස් – බල කරනවා , බලය

By force – බයි ෆෝස් – බලහත්කාරෙන්

Wet – වෙට් – තෙත්

Well – වෙල් – හොඳින් , හොඳයි

Well - වෙල් - ලිඳ

Feel – ෆීල් – දැනෙනවා , හැඟෙනවා

Dizzy – ඩිසී – හිස කැරකෙන ගතිය

Disturb – ඩිස්ට(ර්)බ් – බාධා කරනවා

School – ස්කූල් – පාසල

Cry – ක්‍රයි – අඬනවා

Insist – ඉන්සිස්ට් – බල කරනවා

Do – ඩූ – කරනවා

Nod – නොඩ් – හිස වනනවා

Nod off – නොඩ් ඕෆ් (නොඩෝෆ් ) – නිදි කිරා වැටෙනවා

Stink – ස්ටින්ක් – දුගඳ හමනවා , දුර්ගන්ධය

Terrible – ටෙරිබල් – භයානක , දරුණු , ඉතා නරක

Terribly – ටෙරිබ්ලි – ඉතා නරක ලෙස , භයානක ලෙස ,

Smelling – ස්මෙලින් – ගඳ ගහන

Scream – ස්ක්‍රීම් – කෑ ගහනවා

Strange – ස්ට්‍රේන්ජ් – අමුතු

Sound – සවුන්ඩ් – ශබ්දය

Temper – ටෙම්ප(ර්) – කේන්තිය

Lose temper – ලූස් ටෙම්ප(ර්) – කේන්ති යනවා

Cost – කොස්ට් – වියදම, මිල

Cost of living – කොස්ට් ඔෆ් ලිවිං – ජීවන වියදම

Skyrocketing – ස්කයිරොකටිං – ඉතා වේගයෙන් ඉහළ යන

Ring - රිං - නාද කරනවා

Ring – රිං – වළල්ල

Lightning – ලයිට්නිං – අකුණු ගැසීම

Thundering – තන්ඩරිං – ගෙරවීම

Heavily – හෙවිලි – දැඩි ලෙස

Quarrel – ක්වොරල් – රණ්ඩු වෙනවා

Stammer – ස්ටැම(ර්) – ගොත ගහනවා

Kidding – කිඩිං – විහිළු කරමින්

Kid - කිඩ් - දරුවා

Get tired – ගෙට් ටය(ර්)ඩ් – මහන්සි වෙනවා

Blame – බ්ලේම් – දොස් කියනවා

Expect – එක්ස්පෙක්ට් – බලාපොරොත්තු වෙනවා

Conduct – කන්ඩක්ට් – පවත්වනවා

Campaign – කැම්පේන් – ව්‍යාපාරය , ප්‍රචාරණ/ චන්ද ව්‍යාපරය

Accident – ඇක්සිඩන්ට් – අනතුර, හදිසි අනතුර / අත්වැරැද්ද

Rapid – රැපිඩ් – වේගවත්

Rapidly – රැපිඩ්ලි – වේගයෙන්

Increase – ඉන්ක්‍රීස් – වැඩි වෙනවා , වැඩි කරනවා

Decrease – ඩික්‍රීස් – අඩු වෙනවා , අඩු කරනවා

Slowly – ස්ලෝලි – හෙමින් ,මන්දගාමීව

Slow down – ස්ලෝ ඩවුන් – වේගය අඩු කරනවා

Imply – ඉම්ප්ලයි – ඉඟි කරනවා , අඟවනවා

Fault – ෆෝල්ට් – වැරැද්ද

At fault – ඇට් ෆෝල්ට් – (යමෙකු ) වැරදියි

Watch – වොච් – නරඹනවා

Watch – වොච් – ඔරලෝසුව

Check – චෙක් – පරීක්ෂා කරනවා

Correct – කරෙක්ට් – නිවැරදි

Incorrect – ඉන්කරෙක්ට් – වැරදි

Wrong – රෝං – වැරදි

Plenty – ප්ලෙන්ටි – අති බහුල , ඕනෑවටත් වඩා ඇති